**State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning**

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper**

**අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**(Sinhala)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - 1**

# (QUESTION PAPER) - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**
**සිංහල භාෂාව හා සාහිත්‍යය - I**
**අ.පො.ස.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
  - **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  - **අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
  - **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
  - **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා , ඒවා පිළිපදින්න.**

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි තද කළු අකුරින් මුද්‍රිත කොටසෙහි අර්ථයට වඩා සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. සේතන් මුදලාලිට **<u>කණකොකා හඬලා</u>** යයි ගම්මු පැවසූහ.
   1) කණකොකා හඬළලා
   2) විනාශය ළං වෙලා
   3) වෙනස්කමක් වෙලා
   4) විනාශ වෙලා

2. ඇය **<u>භය හතර නොදන්නා</u>** ළදැරියක සේ ජීවත් විය.
   1) කිසිදු දෙයක් දන්නේ නැති
   2) කිසි කලබලයක් නැතිව
   3) දැනුම් තේරුම් නොමැතිව
   4) පාසලේ 6 ශ්‍රේණියට වත් නොගොස්

3. නිමල් සිය පවුල හා දෙමාපියන් සමඟ **<u>අත් වැල් බැඳගෙන</u>** ජීවිතය ගත කළේය.
   1) අත් දෙකින් අල්ලා
   2) තරහ මරහ අමතක කොට
   3) ඉතා පහසුවෙන්
   4) එකට එක් වී

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. ගොවිතැන සඳහා පළමු වර ජල නිකුතුව .................... වේ.
   1) නානුමුරය
   2) දියකැපීම
   3) දියවර මංගල්‍යය
   4) දියබෙත්ම

5. විවිධ අරමුණු පසිඳුරන්ගේ මාර්ගයෙන් අපේ මනසට පිවිසීමෙන් විවිධ .......................මැවේ.
   1) සංකල්ප රූප
   2) වාක් චිත්‍ර
   3) මනෝකාය
   4) කාව්‍ය සංකල්පනා

6. විදේශිකයන්ගේ පමණක් නොව ස්වදේශිකයන්ගේ ද නෙත්සිත් ............................ කරගන්නා වෙරළ තීරයක් අප සතුය.
   1) වෛවර්ණ
   2) ආකර්ෂණීය
   3) සංක්ෂිප්ත
   4) උදාර

7. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි පද ගැළපූ වරණය තෝරන්න
   1) නා, නී, පියෙල, දොඹ
   2) පියෙල, දොඹ, නා, නී
   3) දොඹ, නා, නී, පියෙල
   4) පියෙල, දොඹ, නා, නී

8. අක්ෂර වර්ගීකරණය අනුව සාවද්‍ය පිළිතුර තෝරන්න.
   1) අ, ක, ඝ, හ - කණ්ඨජ අක්ෂර
   2) ඉ, ඊ, ය, ඣ- තාලුජ අක්ෂර
   3) ඍ, ඨ, ඩ, ණ - දන්තජ අක්ෂර
   4) උ, ප, බ, ම - ඕෂ්ඨජ අක්ෂර

9. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1) දණ්ඩන, දර්ශනපතය, සමස්තය දෘෂ්ටිය
   2) ප්‍රහල, මැතිඳාණ, සුරනර, සම්භාෂණය
   3) චන්දන, දන්ත, නිර්මාණ ඇඹුල
   4) ප්‍රකාශන, රක්ෂණය, ඖෂධාලය, පුස්තකාලයීය

10. දීර්ඝ ඇදය, රකාරාංශය, ගයනුකිත්ත, රේඵය පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1) කුරුණෑගල, ග්‍රන්ථය, ගෞරවය, කර්මය
   2) කූඹියා, පුස්තක, ඍණ, ධර්මය
   3) කුරටියා, භ්‍රමණය, පෞරාණික, කර්මය
   4) නැවියා, දුබල, ගෘහය, වර්මය

11. තද්ධිත පද පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
   1) බුද්ධිමත්, සිල්වත්, මොළකැටි, පුරාතන
   2) ස්වදේශීය, සුහදතා, දුබල, හැකියා
   3) පොඩිති, සෞන්දර්යය, නැටුණු, කාලීන
   4) වරලස්, ඉහටිය, බැලුම්, ජනතා

12. උපසර්ග පද පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
   1) අභිලාෂය, කුසලතා, සුවිශේෂ, දුදන
   2) අවසඳ, නිර්මාණ, ප්‍රබල, නයන
   3) අදිපති, දුර්ජන, පරදේශ, ප්‍රතිවිපාක
   4) විමල, උපවන, ගැයුම්, පැවතුම්

13. පරරූප, ආගම, පරස්වරලෝප, ද්විත්වරූප යන සන්ධි සඳහා ගැළපෙන පිළිතුර වන්නේ
    1) දඬුවම්, සුරත, අස්සන, වැද්දා
    2) වටොර, දැල, විස්සම්, කටුවල
    3) තප්පර, වියවුල්, බුදුකුරු, කුරුල්ලා
    4) උපනූපන්, පිළිතුරු, සතුරා, මහේසිකා

14. නිවැරදි විසන්ධිය ඇති පද පේළිය තෝරන්න.
    1) ගෙන + ආවා, අනු + උත්, සුර + අඟන, සිත් + කරු
    2) හිඟුරු + අල, බිය + ඇති, නුවන් + අග, පස් + සාලිස්
    3) කටු + අල ,නැව් + අයාට, ගඟ + තෙර, ලිප් + ගල
    4) වල් + ඌරා, උගත් + තෝ, ගෙත් + කම්, සු + අසු

15. ‘තාරා’ හා ‘නට’ යන පද දෙක අයත් වන්නේ
    1) නාම පද හා ධාතු ප්‍රකෘති
    2) නාම හා ක්‍රියා පද
    3) නාම ප්‍රකෘති හා ක්‍රියා පද
    4) නාම ප්‍රකෘති හා ධාතු ප්‍රකෘති

16. <u>අහසින්</u> තරුවක් කඩා වැටෙනවා
    දන්නෝ <u>බුදුන්ගේ</u> ශ්‍රී ධර්මස් කන්ධා
    <u>පුතුනේ</u> මේ අහගන්න
    <u>පුෂ්පයෙන්</u> වන සුන්දර වේ ලංකෘත වේ

ඉහත ගීත ඛණ්ඩයන්හි ඉරි ඇඳි පද අයත් විභක්ති අනුපිළිවෙළන් දැක්වෙන්නේ
    1) අවධි, ආධාර, සම්ප්‍රදාන, ආලපන
    2) අවධි, සම්බන්ධ, ආලපන, කරණ
    3) අවධි, සම්ප්‍රදාන, ආලපන ,කර්ම
    4) අවධි, සම්බන්ධ, ප්‍රථමා, කර්ම

17. ඇය <u>හඬමින්</u> නිවසට ගියාය.
    <u>බල</u> මහ මුහුද අව සඳ උතුරින් පෙනෙන
    සතුරන් එනු <u>බලා</u> ඔහු සටන් බිමට ආවේය.
    <u>කියත</u> උන් මෙතෙපල

ඉහත ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද අනුපිළිවෙළින් දැක්වෙන්නේ
    1) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
    2) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
    3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
    4) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

18. “ආකාශයේ පිපී වැනී ගිය තරු කාලයක් සේ පිරිවරා සිටින රහත් පෙලකින් හා පුන් සඳු සේ
    දිලිසෙන ස්වාමි දරුවාණන් ගේ ශ්‍රී විභූතිය දැක”
ඉහත උපුටනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ
    1) බුදුන් වහන්සේ තරුවටත් රහත් පෙළ සඳටත් උපමා කරයි.
    2) බුදුන්වහන්සේ තරුවටත් රහත් පෙළ සඳටත් රූපක කරයි.
    3) අහසේ තාරකා සමූහයට රහත්පෙල උපමා කරන අතර බුදුන් වහන්සේ සඳට රූපක කරයි.
    4) අහසේ තාරකා සමූහයට රහත් පෙළ උපමා කරන අතර ම සඳුට බුදුන් වහන්සේ උපමා කරයි.

19. '**සබවස කුලුණු මෙත් මුදිතා** දහම් සැම' යන පද්‍ය පාඨයෙහි කළු කර ඇති පදයන්හි නිවැරදි අර්ථ විවරණ අනුපිළිවෙල දැක්වෙන්නේ
    1) සත්‍ය, මෛත්‍රිය, කරුණාව, මුදිතාව
    2) සත්‍ය, කරුණාව, මෛත්‍රිය, මුදිතාව
    3) යහපත් වචනය, කරුණාව, මෛත්‍රිය, මුදිතාව
    4) සත්‍ය වචනය, කරුණාව, මෛත්‍රිය, මුදිතාව

20. A. කියන්නා
    B. කියනු
    C. රකින්නෝ
    D. රකින

ඉහත දැක්වෙන පද අතරින් කෘදන්ත නාම පමණක් දැක්වෙන්නේ
    1) A හා C
    2) B හා D
    3) A හා D
    4) B හා C

21. සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න
    1) භවය - ජාතිය, ප්‍රාර්ථනා - පැතුම්, තදින් - තර, විළිය - ලැජ්ජාව
    2) රුහිරු - ලේ, පද්ම - නෙළුම්, රුවන් - රත්‍රන්, සින්ධුපමාන - සාගරය තරම්
    3) සක්වල - චක්‍රවාටය, සූර්යයා - දිනකර, ගස් - ධූම, කාන්තාව - දිගැසි
    4) අහස - නබෝගැබ, නිවස - ගෘහය, නෙලුම් - අරවින්ද, ජලය - පැන්

22. විරුද්ධාර්ථ පද යුගලයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.
    1) සුසිරිත - දුසිරිත
    2) ඌන - අනූන
    3) ස්වාධීන - පරාධීන
    4) දේශීය - ස්වදේශීය

- 23,24,25 වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

23.
    1) ඔවුහු ක්‍රීඩකයන් වෙති
    2) ඔහු කවියෙක්
    3) අපි සියල්ලන්ම නළුවෝ වෙමු
    4) දරුවන් අවංක නොවන්නේ ඇයි?

24.
    1) සිසුහු ක්‍රීඩා පිටියට පැමිණ නැත.
    2) මා ඒ පොත කියවා ඇත්තෙමි.
    3) ඕ තොමෝ ගමට ගියහ.
    4) ගුරුවරු රැස්වීමේ ඇත.

25.
    1) සතුරෝ පහර දෙති'යි ගම්වැසියෝ බිය වූහ.
    2) දේශපාලනඥයෝ හා මිනිස්සු රැස්වීමට ආහ.
    3) අපි ශිෂ්‍යයෝ හා කතා කළෙමි.
    4) මව හෙවත් අම්මා දරුවන්ට බත් බෙදා දෙති.

26. පහත දැක්වෙන පද යොදා හිස්තැන් පිරවීමේ දී නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.

A. ඉක්බිති B. විරූ C. විනා D. මැනවි

- දෙවියන් .................... මට පිළිසරණක් නැත.
- ඔබ අපට සමාව දුන .................
- .................. සියල්ලෝම විසිර ගියහ.
- පෙර නොවූ ............ සටනක් කළ යුතුව තිබේ.

1) C,D,A,B
2) B,C,D,A
3) A,B,D,C
4) D,C,B,A

27. අය මාර්ග මුළුමනින්ම විනාශ කර දැමීම යන්නට ගැළපෙන පිරුළ වන්නේ
1) ඌරෝ කවද ද කහ කෑවේ
2) වක්කඩේ හකුරු හැංගුවා වගෙයි
3) අතු කඩා මොර කන්නා සේ
4) අලි මදිවට හරක්

28.“එගොඩ ගොඩේ උල ලේනා හඬන්නේ” යන කවි පදයෙහි අර්ථය නිවැරදිව දැක්වෙන්නේ
1) උල ලේනෙක් හඬන බව
2) ගැමියන්ගේ බලාපොරොත්තුවක්
3) මරණයක් සිදුව ඇති බව
4) අසුභ ආරංචියක පෙරනිමිත්තක් බව

29. “අපි විද්වතුන් දකිමු” යන වාක්‍ය කර්මකාරකයට හැරවීමේදී නිවැරදි වන්නේ
1) අප විසින් විද්වතුන් දැක්කෙමු.
2) අප විසින් විද්වත්හු දකිනා ලදහ.
3) අප විසින් විද්වත්තු දැකෙති.
4) අප විසින් විද්වත්තු දක්නා ලද්දෝය.

30. පහත සඳහන් ‘අ’ සහ ‘ආ’ කොටස් දෙකෙහි අතීත ව්‍යවහාරයන් හා සංඛ්‍යා ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ

| | අ | | ආ |
|---|---|---|---|
| 1. | සොළස | A. | 16 |
| 2. | එකුන් තිස | B. | 14 |
| 3. | තුදුස | C. | 29 |
| 4. | තෙළෙස | D. | 17 |

1) 1 – A
2) 2 – B
3) 3 – C
4) 4 – D

31. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත පිළිතුර තෝරන්න.
   1) උපමාවාචී නිපාත - එව්, බඳු, විලස්, මෙන්
   2) ශීඝ්‍රාර්ථයේ නිපාත - වහා, සේද, හනික, යුහුව
   3) සීමා අර්ථයෙන් නිපාත - තෙක්, තුරු, සෙට, දක්වා
   4) පද සම්බන්ධ කිරීමේ නිපාත - හා, සහ, සමග, කැටුව

32. "උඹ මිනිහෙක් වෙයන් පුතේ
   කුසගිනි වෙයි එකම සතුරු" මෙම ගීත ඛණ්ඩය ඇතුළත් නාට්‍ය වන්නේ
   1) සිංහබාහු නාට්‍යය
   2) හුණුවටයේ කතාව
   3) මනමේ නාට්‍ය
   4) පේමතෝ ජායතී සෝකෝ

33. නිවැරදිව ගැලපෙන පද යුගල තෝරන්න.

| | | | |
|---|---|---|---|
| A. | හැන්දිරාල | E. | ඔරු අයිති කරුවා |
| B. | ඉල්ලම් කූර | F. | ඉල්ලම |
| C. | මහ එක | G. | අලියා |
| D. | ගඟුල බානවා | H. | හානවා |

   1) A-F, B-G
   2) A-E, C-G
   3) C-F, D-E
   4) B-H, C-E

34. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නගර නාමය නිවැරදිව ඇතුලත් වරණය තෝරන්න.
   1) අරනාරපු
   2) දෙණි - දඹ
   3) පහුවයා
   4) මනුවර

35. හංස සන්දේශය හා සැළලිහිණි සංදේශය කතුවරුන් නිවැරදිව දැක්වෙන්නේ
   1) අලගියවන්න මුඛවෙටි හා තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
   2) වීදාගම මෛත්‍රී හිමි හා තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
   3) දෙවෙනි පරාක්‍රමබාහු රජු හා තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
   4) වීදාගම ගුණානන්ද හිමියෝ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

36. I කොටසේ ඇති රූඩි පද සඳහා II කොටසේ නොගැළපෙන අර්ථය සහිත වරණය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| A. | කඹ අදිනවා | E. | ක්‍රියාත්මක නොකිරීම |
| B. | සුදුහුණු ගානවා | F. | වැරදි වසන් කිරීම |
| C. | බඩට ගහනවා | G. | ආහාර නොදීම |
| D. | තරු පෙනෙනවා | H. | කරදරයට පත් වීම |

   1) A හා E
   2) B හා F
   3) C හා G
   4) D හා H

37. පහත වාක්‍ය තුළින් අදහස නිවැරදි ව දැක්වෙන වාක්‍ය තෝරන්න.
   1) සිංහල අක්ෂර මාලාවේ ප්‍රාණාක්ෂර විස්සකි.
   2) ඍ,ඎ යන අක්ෂර වර්තමානයේ භාවිතයේ නොයෙදෙයි.
   3) නිපාත උපසර්ග යනු ප්‍රත්‍යයාර්ථ නාම වේ.
   4) කර්තෘ කාරක වාක්‍යක කර්ම පදය අනුක්ත වේ.

38. <u>කහකුරුල්ලා</u> අත්තෙහි හිඳියි.
   පාළු නිවසෙහි <u>වේපස්</u> ඇත.
   <u>ගුළුගොනගුල්</u> තුරු හිස් මත සැරි සරයි.
   <u>ඉර සඳ</u> යන ස්වභාවික වස්තූන් පුරාණයේ දේවත්වයෙන් සලකා ඇති බව පෙනේ.

මෙහි ඉරි ඇඳි පද අයත් සමාස අනුපිළිවෙල දක්වා ඇති වරණය තෝරන්න.
   1) විශේෂණ, විභක්ති, අන්‍යාර්ථ, දකාරාර්ථ
   2) විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ, දකාරාර්ථ
   3) දකාරාර්ථ, විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ
   4) විශේෂණ, අන්‍යාර්ථ, විභක්ති, දකාරාර්ථ

39. පහත සඳහන් කවිය අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වර්ණය තෝරන්න.

නො වි ත ර තෙද බලැති මහතුන් හට පවර
වැ ර සැ ර නො වන නුනුවණ දන බඳිනු වෙර
තු ඟු ත ර ගිරි පපන දළ දළඟින් පැහැර
ම ත ව ර ගිජිඳුට පෙදෙනැත වෙහෙසෙන අයුර

   1) මහතුන්ට වෙර බැඳීම මත් රජෙකුට වෙහෙසුනා වැන්න
   2) උතුම් වීරසාර ගුණ ඇති මහතුන් පරාජය කළ නොහැකි බව
   3) අප්‍රමාණ තේජස බලය ඇති උතුම් මහතුන්ට නුවණින් අඩු මිනිසුන් වෛර බැඳීම විශාල පර්වත දැඩි දළ අඟින් පහර දෙන මත් ඇතෙකු පයින් ඇන වෙහෙස ගන්නාක් වැනි බව
   4) උතුම් මහතුන්ට නුවණින් අඩු මිනිසුන් වෛර බැඳීම ප්‍රයෝජනයක් නොවන බව

40. "හිමි ඔබ සයුර මැද රුදු සටනකය රැයේ" යන පද්‍ය ඛණ්ඩයෙහි සමීප අර්ථය දෙන වර්ණය තෝරන්න.
   1) ස්වාමියා සයුර මධ්‍යයේ සිටින බව
   2) ස්වාමියා රාත්‍රියේ සයුරෙහි සිටින බව
   3) ස්වාමියා සටනක නිරත වන බව
   4) ස්වාමියා රාත්‍රියේ සයුර මධ්‍යයේ දරුණු සටනක යෙදෙන බව